දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක - 01 /2014

බන්ධනාගාර මූලස්ථානයේ සියළුම මාණ්ඩලික නිළධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරිවරු,
සහකාර අධිකාරිවරු,

මගේඅංකය - බ/14/1/1
බන්ධනාගාර මූලස්ථානය.
කොළඹ 09.
2014.01. 01 දින.

<u>වාහන අළුත්වැඩියාව සහ යන්ත්‍රසූත්‍ර අළුත්වැඩියා කිරීම</u>

වාහන හා යන්ත්‍රසූත්‍ර අළුත්වැඩියාව සිදු කිරීමේදී මින් ඉදිරියට පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතුය.

1. සියළුම වාහන අළුත්වැඩියා සඳහා කරන ඉල්ලීම් බන්ධනාගාර කොමසාරිස් (පාලන)වෙත යොමු කළ යුතු අතර යන්ත්‍රසූත්‍ර අළුත්වැඩියාවන් සඳහා කරන ඉල්ලීම් බන්ධනාගාර කොමසාරිස් (සැපයුම්) වෙත ඉදිරිපත් කල යුතුය.

2. මූලස්ථානයට අදාලව මෝටර්රථ වාහන සඳහා මිල ගණන් කැඳවීම්බන්ධනාගාර කොමසාරිස් (පාලන) නියෝග මත මූලස්ථාන අධිකාරි මගින් සිදු කල යුතු අතර යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියාවන් සඳහා මිල ගණන් කැඳවීම බන්ධනාගාර කොමසාරිස් සැපයුම් මගින් කළ යුතු යුතුය.

3. වාහන යන්ත්‍රසූත්‍ර සඳහා අළුත්වැඩියාවට පෙර කළ යුතු අලුත්වැඩියා පිළිබඳ වාර්තාවක් / නිර්දේශයක් හා අළුත්වැඩියාවෙන් පසුව සාර්ථකව අළුත්වැඩියාව සිදු කර ඇති බවට හා ගෙවීම් නිර්දේශය මූලස්ථානයේ යාන්ත්‍රික ඉංජිනේරු /රජයේ අනුමත යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක්/ බලයලත් මෝටර්රථ පරීක්ෂක විසින් සිදු කළ යුතුය.

4. බන්ධනාගාර ආයතනවල මිල ගණන් කැඳවීම අදාළ බන්ධනාගාර ආයතන විසින් සිදු කර බන්ධනාගාර කොමසාරිස් (පාලන) වෙත ඉදිරිපත් කල යුතුය.

5. ගෙවීම් අනුමත කිරීම් පවරා ඇති බල සීමාව තුල/ අමාත්‍යාංශ ලේකම්,බන්ධනාගාර කොමසාරිස් ජනරාල්,බන්ධනාගාර කොමසාරිස්(ආයතන),බන්ධනාගාර කොමසාරිස් (සැපයුම්) , අධිකාරිවරු, සහකාර අධිකාරිවරු විසින් කටයුතු සිදු කරනු ඇත.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත:- කොමසාරිස් (පාලන) - චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම සඳහා.
කොමසාරිස් (සැපයුම්) - එම
ඉංජිනේරු (යාන්ත්‍රික) - එම